**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 26 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බිල්පත් ඉදිරිපත් නොකල කර්මාන්ත 19 ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන නොසැලසීම නිසා වර්ෂයේ වියදම හා ණයහිමියන් රු.400,000 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 **නොසැසඳූ පාලන ගිණුම්**

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය ශේෂ පත්‍රය හා උපයෝගී ලේඛණ සමඟ සැසඳීමේ දී රු.177,230 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 35,233,894 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.16,962,949 ක් විය.

1.3.5 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු.25,680,163 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වටිනාකම් සහිත උපලේඛණ සහ ලේජර් ගිණුම ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)i වගන්තිය | කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 11 දෙනෙකු බඳවාගැනීමේ දී පළාත් පාලන කොමසාරිස් වරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ඉන්ධන පිරවුම්හල සඳහා පරිසර බලපත්‍රයක් නිකුත් කර නොතිබූ අතර, 2013 වර්ෂය වෙනුවෙන් සභාවෙන් වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු ඇඹරුම්හල් 35 ක් හා වඩු කර්මාන්ත ශාලා 10 ක් පරිසර බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 371 | සභාව විසින් 1991 - 2011 අතර කාල පරාසය තුල අවස්ථා 09 කදී ලබාදෙන ලද රු.296,757 ක අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,219,576 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,300,965 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,918,611 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් හා බදු | 1,999,131 | 1,808,775 | 190,356 | |
| කුලී | 1,101,829 | 1,079,037 | 22,792 | |
| බලපත්‍ර ගාස්තු | 627,811 | 650,810 | (22,999) | |
| සේවා සඳහා ගාස්තු | 5,484,549 | 9,182,819 | (3,698,270) | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,534,486 | 1,517,948 | 16,538 | |
| වෙනත් ආදායම් | 9,525,223 | 636,926 | 8,888,297 | |
| ආදායම් ආධාර | 11,637,238 | 9,039,679 | 2,597,559 | |
| | | | | 7,994,273 |

පුනරාවර්තන වියදම
---------------------

| | | | | |
|---|---|---|---|---|
| වැටුප් හා දීමනා | 13,293,467 | 11,383,550 | (1,909,917) | |
| ගමන් වියදම් | 539,850 | 509,318 | (30,532) | |
| සැපයුම් හා උපකරණ | 1,419,299 | 1,087,341 | (331,958) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 695,574 | 1,874,509 | 1,178,935 | |
| ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා | 2,457,776 | 2,523,840 | 66,064 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 101,490 | 33,245 | (68,245) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 183,236 | 203,227 | 19,991 | |
| | | | ----------- | (1,075,662) |
| | | | | ------------ |
| | වාසිදායක විචලනය | | | 6,918,611 |
| | | | | ======== |

2.3 **ආදායම් පරිපාලනය**
---------------------

2.3.1 **බදු කුලී**
--------

(අ) 2013 දෙසැම්බර් 31 වන විට සභාව සතු ඇතැම් කඩ කාමර සඳහා මාස 13 සිට මාස 58 දක්වා කාල පරාසයකට අදාල හිඟ කුලී රු.164,299 ක් වූ අතර, එම හිඟ කුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) කඩ කාමර 08 ක් වෙනුවෙන් 1990-1996 කාලයට අදාලව පැවති හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණ අතර, එම නඩුවේ තීන්දුව ප්‍රකාරව හිඟ අයකර ගෙන නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට එම කඩ කාමර සඳහා හිඟ මුදල රු.108,616 ක් විය.

2.3.2 **බලපත්‍ර ගාස්තු**
----------------

2013 වර්ෂයට අදාලව විධිමත් සමීක්ෂණයක් මඟින් වෙළඳ බලපත්‍ර අයවිය යුතු ව්‍යාපාර හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවිදඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | |
|---|---|
| උසාවි දඩ | 3,653,693 |
| මුද්දර ගාස්තු | 1,740,208 |

3. **මෙහෙයුම් සමාලෝචනය**
------------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
---------------------------------

පළාත් පාලන කොමසාරිස්වරයාගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් වසර 05 කට වරක්වත් ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ

තක්සේරුකරුවකු මඟින් කඩ කාමර සඳහා මාසික බදු කුලිය තක්සේරු කරවා ගත යුතු වුවද, සභාව සතු කඩ කාමර 79 ක් සම්බන්ධයෙන් එවැනි තක්සේරුවක් සිදු කර නොතිබුණි.

3.2. **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2013 වර්ෂය වන විට සභා බල ප්‍රදේශය තුල ස්ථාන 04 ක සන්නිවේදන කුළුණු ඉදිකර තිබුණි.

(ආ) ඇප තැන්පත් සඳහා සභාවේ සේවකයින් 13 දෙනෙකු විසින් තැන්පත් කර තිබුණු රු.84,900 ක මුදල් සේවකයින්ගේ එක් එක් නම්වලින් බැංකු ගිණුම්වල ආයෝජනය කර නොතිබුණි.

3.3 **නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

(අ) 1993 වර්ෂයේ දී යුධ හමුදා රාජකාරි සඳහා රැගෙන ගොස් ඇති අංක 53-5074 දරන ඩබල් කැබ් රථය 2014 ජුනි වන විටත් සභාවට ආපසු පවරාගෙන නොතිබුණි.

(ආ) අංක EMDI - 120 ෆාම් මාස්ටර් අත්ට්‍රැක්ටරය අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර ආහාර හා කෘෂිකාර්මික සංවිධානය විසින් වියලි කලාපීය ජීවන උපායන් සඳහා සහායවීමේ වැඩ සටහන යටතේ පවුල් 200 කට ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් රු.1,107,927 ක අරමුදල් යොදවා ඉදිකර තිබු ගොඩනැගිල්ල 2012 ඔක්තෝබර් 31 වන දින විවෘත කළද මේ වන විට නිෂ්කාර්යව පැවතුනි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කල අයවැය ලේඛණයෙහි අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම | අයවැයගත | තත්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | | % |
| වරිපනම් හා බදු | 1,521,540 | 1,999,131 | 477,591 | 31 |
| බලපත්‍ර ගාස්තු | 823,500 | 627,812 | 195,688 | 24 |
| සේවා සඳහා ගාස්තු | 3,160,000 | 5,484,549 | 2,324,549 | 73 |
| වෙනත් ආදායම් | 723,000 | 9,525,223 | 8,802,223 | 1217 |
| ආදායම් ආධාර | 10,022,196 | 11,637,238 | 1,615,042 | 16 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| වැටුප් හා දීමනා | 11,381,456 | 13,293,467 | 1,912,011 | 16 |
| සැපයුම් හා උපකරණ | 1,085,000 | 1,419,299 | 334,299 | 31 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 970,000 | 695,574 | 274,426 | 28 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආරක්ෂක සේවා | 2,890,000 | 2,457,776 | 432,224 | 15 |

| | | | | |
|---|---|---|---|---|
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 254,000 | 101,490 | 152,510 | 60 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 230,015 | 183,236 | 46,779 | 20 |

**5.** **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ආදායම් පරිපාලනය